

# සුභාවිත ගීතයේ ස්නේහවන්තයා
# සිසිර දීසානායක

**ස්වර්ණකාන්ති රාජපක්ෂ**

**ප්‍රවීණ ගීත රචක සිසිර දිසානායක සිය නිර්මාණ ඔස්සේ කළ සමාජ සත්කාරය අගය කරනුවස් උපහාර උළෙලක් අගෝස්තු 29 සෙනසුරාදා සවස 6ට කිව් හයි ස්කූල් හි රෙනයිසන්ස් තියටර් හිදී පැවැත්වෙයි.**

**සිසිරට සන්නසේ උපහාරය ද පිදෙයි.**

නැත නැත ගියේ තනිකරලා ලිපි ගොන්නේ
හිත හිත උන්නෙ කවදා දෝ දැක ගන්නේ
සොය සොයා ඇවිත් ආයෙම තුරුලට ගන්නේ
සිප සිප විදිමි සුසුවද මගෙ කවි ගොන්නේ

මව් පිය සෙනන් නෙත් කෙමෙණිය තෙත් කෙරුව
ගුමු ගුමු බමර ගී ගන්වා පෙම් පිරුව
ඇති ඇති සැටිය දැක ලෝකේ ගැන කීව
යළි යළි වැලඳ ගම් ආදර නව් ගොනුව

බැලූ බැල්මට සරල කවි පන්තියක් සේ හැගුණත්

නිර්මාණය යන වචනයෙන් අර්ථ ගැන්වෙන්නේ චාරයක් නොමැති බවය.තවත් දුරට පැහැදිලි කළහොත්, එය සීමා පවුරු වලින් නොබැඳි නිදහසේ ඉතිර පැතිර යන්නාවූ ප්‍රතිභා ශක්තියක මිහිරි ඵලයයි. නිර්මාණ කෞෂල්‍යය වනාහි ජන”මයෙන් ලබන්නා වූ සුවිශේෂී වාසනා ගුණයකි. මිනිසත්බව ලද සියළු දෙනාටම එය පිහිටන්නේ නැත. එබඳු ජන්ම ශක්තිය ස්වකීය උද්යෝගය, සත්‍ය අභ්‍යාසය, ගවේශශීලීබව සමඟ මුසුවන බුද්ධි ප්‍රභාවයෙන් ඔප්නගා ගැනීමේන සැබෑ නිර්මාණකරුවෙකු ඉස්මතු වන්නේය.

ගමේ පාසලින් මෙන්ම කොළඹ ආනන්ද විද්‍යාලයෙන්ද අධ්‍යාපනය ලබා පසුකලෙක චරලත් ඉංජිනේරුවෙකු වශයෙන්ද අනතුරුව රථවාහන ඉංජිනේරු විද්‍යාපති පශ්චාත් උපාධියෙන්ද ශක්තිමත් වූ සිසිර දිසානායක සහෘදයාගේ ජීවිත ගමන වෘත්තීය සුදුසුකම් නමැති කොටුව තුළට සීමා වූයේ නැත. ජීවිතයේ නිම් වළලු පුළුල් කරමින් සහජයෙන් ලද අපූරු නිර්මාණ ශක්තිය ඉව ඇසුරින් විවිධ මානයන් ඔස්සේ සිය ජීවිතයට ආස්වාදනීය වූ නව අදහස් සොයා සපයමින් විහිඳ යන ආලෝක ධාරාවන් බවටය.

නව යොවුන් වයසේ සිටම ලේඛනයට ඇල්ම කල සිසිර විවිධ වූ ලේඛන කාර්යයන්හි නිරත වූයේය. ගීත රචනා,පද්‍ය රචනා , තීරු ලිපි ආදිය නිබඳවම ඔහුගේ පන්හිදෙන් ලියැවුණෝය.

ප්‍රභල කාව්‍යමය ලක්ෂණ වලින් හැඩ වන්නාවූ සිසිරගේ ගී පද රචනා සමුච්චය විරල ප්‍රතිභාවක තතු කියා පාන්නේය. ඔහුගේ ළමා ගීත, බොදු බැති ගිත, ප්‍රේම ගීත මෙන්ම ප්‍රහසනය සහ උපහාස රසයෙන් කූළු ගැන්වී ඇති විවිධ පර්යේෂණාත්මක ගීත නිර්මාණ විරල ගණතයේ නිර්මාණයක උරුමය කියා පාන්නේය. සිය නිරීක්ෂණශීලී දෑසට හසුවන සමාජ දේශපාලනික සහ ගේහසික අනුභූතීන් උපයෝගී කරගනිමින් පුළුල් පරාසයක් හසුකර ගනිමින් සදැස් මෙන්ම නිසදැස් ආකරරයෙන් නිමවෙන කාව්‍ය සංකල්පනාවන් බොහොමයක අව්‍යාජ ගැමි සුවඳ තවරන්නට ඔහු දක්වන නිසඟ දක්ෂතාව මඟින් තමා ප්‍රවේශ වන්නාවූ කාර්යයන් සඳහා ඔහු තුළ පවත්නා ඇපකැපවීම, පෙර සූදානම, අවබෝධය සහ සතත අභ්‍යාසය ප්‍රකාශ වන්නේය. ප්‍රේම ගීතයක් රචනා කිරීමේදී සිසිරගෙන් පළවන නිර්මාණවේශය ළගන්නා සුළුය. ඔහු විසින් යොදා ගනු ලබන යෙදුම් උපමා රූපක ආදිය කොතැනකින් හෝ අහුලා ගෙනවිත් චරචනය තුළට ඔබන ලද සත්ත පද නොවේ. ගැලපෙන සුළු වූද ගලා යන සුළු වූ ද ආකාරයෙන් ඉසියුම් කල්පනාකාරී ස්වභාවය යොදන ලද පද වැල් නිසා නිර්මාණයේ අරුත් පිරි බව ගීතවත් බව සහ අලංකාරය නිරායාසයෙන් ඉස්මතු වන්නේය. ඒත් රැයකින් ප්‍රවීණ නිර්මාණකරුවකු වීමට අර අඳින ආධුනිකයන්ට සිසිර දිසානායකයන් පරමාදර්ශයක් වන්නේය.

ලයනල් රන්වලයන් සමඟින් සම්බන්ධ වී අප සහෘ දයා විසින් ජනගත කරන ලද ගම අවුලකද්කදං ජන ගී සමුච්චය විරල ගණයේ පබැඳුම් වලින් සරු සාරය. දිවයිනේ විවිධ දුර බැහැර පළාත් වල දේශීය ජන කොට්ඨාශන් අතර භාවිත වූ අව්‍යාජ බස් වහර සහ ජන වහර සැලකිල්ලෙන් යුතුව ගවේෂණය කරමින් අපූර්ව වු රස නිෂ්පාදිතයක යෙදෙන්නට තරම් ඉවසිලිවන්තබවක් සිසිර සිය නිර්මාණකරණයේදී තහවුරු කර ඇත.

අග්‍රහණය සංගීතවේදී වික්ටර් රත්නායක සූරින් විසින් සංගීතවත් කොට ගායනය කරන නියපෙළ සිඳලයි. ගීතය උතුම් වූ දාරන ප්‍රේමයේ සුසිනිඳු ලක්ෂයන් ස්පර්ශ කරනා සංවේදී වූද කවි ලකුණුවලින් පිරිපුන් වූද නිර්මාණයකි. පූර්ව නිර්මිත තනුවකට පද යෙදීම ද සිසිර සිය නිර්මාණකරණයේදී තහවුරු කර ඇත. ගායනය සහ වාදනය අංශයන්ගෙන්ද සිසිර ලබා ඇත්තේ වැදගත් ස්ථානයකි.

පසුතල නිර්මාණය සහ චිත්‍ර කලාවද අභිරුචියක් දක්වන සිසිර දිසානායක කලාතරුවා විශේෂයෙන් රේඛා චිත්‍ර සහ ආලේඛ්‍ය චිත්‍ර කෙරෙහි අපූරු දස්කම් දක්වයි. වෘත්තීය ඉංජිනේරුවකු වශයෙන් ඉදිකිරීම් සහ සැලසුම් කාර්යභාරයන්හි නිපුණයෙකු වන ඔහු ගේ තවත් එක් හපන්කමක් ගැන අසන ඔබ විස්මයට පත්වනු ඇත. ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ග පද්ධතිය පිළිබඳව අද අප කවුරුත් කතා කරන්නේ සතුටින් සහ ආඩම්බරයෙන්ය. මෙම සැලසුම් ජාලයේ අරම්භක ව්‍යාපෘතිය (එය නිම කිරීමට නම් මඳක් පමා විය) වූ කොළඹ - කටුනායක අධිවේගී මාර්ගසැලසුම් නිර්මාණය සිවිල් ඉංජිනේරු සිසිර දිසානායකගේ දායකත්වයෙන් ඉටු විය. දැනට භුවමාරුව Interchange නමින් හඳුන්වනු ලබන්නේ සිසිර විසින් මංමාරුව වශයෙන් සඳහන් කර ඇති සැලසුමයි. එය ඓතිහාසික කාර්ය භාරයකි.

පසුගිය දා රසවිඳින්නට ලැබුණු සිසිරගේ කුඩා පැදියක් ගැන සදහන් කරන්නට කැමැත්තෙමි.

සිසිරගේ රැස්වයං කථනයක් සේ පෙනුණත් යළි යළිත් එය කියවීමේදී එතුළ ගැබ්වුණු හාස්‍යයට මුසු සනාතන සත්‍යයක් පසක් කළ සැමටම විස”මයජනක සතුටක් ඇතිවිය. මේ සරල වාග් චිත්‍රය තුළින් සිසිර හෙළිදරව් කරන්නේ සෑම නිර්මාණකරුවෙකුගේම හද ගැඹුර කලඹන හැඟුම් සමුදායක් ගැන නොවෙද? එය සැබවින්ම අපූරුය.

පිදිය යුත්තන් පිදීම මංගල කරුණකි. අප හෙළදිවට සුපුරුදු මහඟු චාරිත්‍රයකි. එමෙන්ම ගුණගරුක ජන සමාජයක යුතුකමක් සහ වගකීමක්ද වන්නේය. ඒ අනුව හෙළ මාත්‍රා සංස්කෘතික පදනම විසින් ඉෂ්ට සිද්ධ කරන්නට යන සිසිර සරණීය ප්‍රණාම උළෙල , සිසිරගේ ශ්‍රමය කාලය සහ දැනුම නොමසුරුවද නිරන්තරවද භුක්ති විදින්නාවූ මෙල්බර්න් නුවර විවිධ සංස්තෘතික සංවිධාන, ජනමාධ්‍ය මෙන්ම හිතවතුන්ගේද සතුටට හේතු වන්නේය. එබැවින් හෙළ මාත්‍රා පදනමට සැමගේ ගෞරවයට සතුටට හේතු වන්නේය.

මේ සුබ නිමිත්ත සිසිර දිසානායක සහෘදයාගේ නිර්මාණ කෞෂල්‍යය තවතවත් තීව්‍ර කරන්නාවූ ප්‍රබෝදක ආවේගයක් වේවා යැයි මෙසේ ශුභාශිංසන පිරිනමන්නේ සොම්නස් සිතින්ය.

SBS සිංහල සේවය

**SBS සිංහල සේවය සඳුදා, අගහරුවාදා, බ්‍රහස්පතින්දා, සිකුරාදා**
**පෙ.ව 11 සිට 12 දක්වා**

සජීවව online අහන්න
www.sbs.com.au/radio - select - SBS radio 2 -Sinhalese

පසුව online අහන්න
www.sbs.com.au/sinhalese
සජීවව on TV - Channel 38

**සජීවව** on Radio
93.1fm - Victoria
97.7fm - NSW
105.5fm - Canberra
106.3fm - SA
93.3fm - QLD
96.9fm - WA

සජීවව හෝ පසුව via Mobile
SBS Radio APP - free download

SBS සිංහල Facebook පිටුව
www.facebook.com/sbssinhalese

කතාකරන්න - (03) 99492169
Fax කරන්න - (03) 99492385
කෙටි පණිවිඩ සඳහා - 042 999 6263
(වැඩසටහන ප්‍රචාරය වන වෙලාවේදී පමණි)

## ගිරිඋල්ල දැතව කනිටු විදුහලේ
# පුස්තකාලයට පොත් අවශ්‍යයි

“මට පොත් එවනවාට වඩා මා උගන්වන දුප්පත් පාසලේ පුස්තකාලයට පොත් ටිකක් ලබා ගන්නට වැඩ පිළිවෙලක් යෙදිය හැකි නම් එය විශාල සේවාවකි” යි කිවියර ප්‍රියංකර නිවුන්හැල්ල මහතා අපට පැවසුවේ ඔහුට යම් පොතක් යවන්නට කතා කළ අවස්ථාවේදීය.

ඔහු උගන්වන්නේ ගිරිඋල්ල දැතව කණිටු විදුහලේ ය. පහසුකම් අඩු පාසලක් වන දැතව කණිටු විදුහලේ පුස්තකාලය සඳහා පොත්පත් ලබාගැනීමට සහය වන්නැයි අපි සන්නස පාඨක ඔබ සැමගෙන් ඉල්ලා සිටිමු. කණිටු විදහලක සිසුනට ප්‍රයෝජනවත් විය හැකි යයි ඔබ සිතන පොත් පත් ඔබ වෙත තිබේ නම් ඒවා සන්නසට බාර දෙන්න. මේ පොත් පත් උතුරු මෙල්බන් ප්‍රදේශයේ අයට තෝමස්ටවුන් හි සූරිය මාකටිං සර්විසස් ආයතනයට ගෙනැවිත් බාරදිය හැකිය.

සිංහල නවකතා කෙටිකතා කවි පොත් හෝ කුඩා ඉංග්‍රීසි පොත් මේ සඳහා සුදුසු යයි අපි සිතමු. පොත් ලබාදිය නොහැකි නම් ඔවුන්ට එම පොත් මිලට ගැනීම සඳහා මූල්‍යමය ආධාරයක් කරන්නටද ඔබට හැකිය. ලැබෙන පොත් ලංකාවට නොමිලයේ යවන්නට මල්ටි ෆ්‍රේට් ආයතනයේ අරුණ විජේතුංග මහතා ඉදිරිපත් වී සිටියි. ඔවුනට ස්තුතියි

ඔබ ලබාදෙන කුඩා පොතක් දරුවකුගේ මුවේ අපූරු සිනා මලක් පුබුදුවනු ඇත. එය කොයිතරම් වටිනවාද?

වැඩි විස්තර සඳහා අමතන්න
ජගත් 0433 438 535